C
374
GUN

# ශ්‍රී ලංකාවේ පාසැල් සිසුන් පාසල් පුස්තකාල පරිහරණය කිරීම පිළිබඳ විමසුමක්.

## ( මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් කිහිපයක් ඇසුරෙනි.)

UNIVERSITY OF PERADENIYA
FACULTY OF ARTS
29 APR 1995
SENIOR ASST. REGISTRAR

පේරාදෙණි විශ්වවිද්‍යාලයේ ( අධ්‍යාපන පීඨයේ) අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ අවශ්‍යතා අර්ධ වශයෙන් පූර්ණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

ජේ.එච්.තුසිතා ගුණසීලි
ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)

1995

නිබන්ධන උපදේශක

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී
ආචාර්ය එල්.ඒ.කොබ්බෑකඩුව මිය.

4769860

# සාරාංශය


ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් පාසල් පුස්තකාල පරිහරණය කිරීම පිළිබඳ විමසුමක් කිරීම මෙම පර්යේෂණ කෘතියේ මූලික පරමාර්ථය විය.

රටක ආර්ථිකය හා අධ්‍යාපනය අතර ඇත්තේ දැඩි සම්බන්ධතාවකි. සංවර්ධනය වන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය නංවීමට වරින් වර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරනු දැකිය හැකිය. එහිදී ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක පදනම මත, පාසල් සිසුන් පාසල් පුස්තකාල පරිහරණය කිරීම පිළිබඳව අවධානය යොමුකිරීම අත්‍යාවශ්‍ය කරුණක් වේ. වත්මන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හිදී නොසළකා හැර ඇති මෙම අත්‍යාවශ්‍ය අංගය පිළිබඳව කරුණු හැදෑරීම ගුරුවරයකු සතු බලවත් යුතුකමක් ලෙසද පර්යේෂකයා සිතයි. මෙම පරමාර්ථය උදෙසා දැරූ පර්යේෂකයාගේ වෑයම පරිච්ඡේද සයකින් ඉදිරිපත් වේ.

පළමුවන පරිච්ඡේදය මාතෘකාව හඳුන්වීම සඳහා යොදා ගැනිනි. මෙහිදී මෙවැනි පර්යේෂණයක අවශ්‍යතාව, පාසල්පුස්තකාල ක්ෂේත්‍රය අළලා කරන ලද දේශීය හා විදේශීය පර්යේෂණ වාර්තා කිහිපයක් පිළිබඳ තොරතුරු ඇතුලත්ය. ඒ හැර මෙම පර්යේෂණයේ අරමුණුද ඉදිරිපත් කර ඇත.

'පාසල් පුස්තකාල ක්ෂේත්‍රය' පුළුල් වශයෙන් සළකා බැලීම සඳහා පුස්තකාල සංකල්පය දෙවන පරිච්ඡේදයට ඇතුලත් කරන ලදි. පාසල් පුස්තකාලය අර්ථ දැක්වීම , පාසල් පුස්තකාලයන්හි අරමුණු, කාර්ය භාරය පුළුල් වශයෙන් මෙහිදී සළකා බලනු ඇත. ඒ හැර පාසල් පුස්තකාල සිසුන් පරිහරණය කිරීම පිළිබඳ කර්තව්‍යයේ නියමුවන් වන පාසල් පුස්තකාලයාධිපති හා ගුරුවරුන්ට අදාල කරුණුද අවධානයට යොමු කරයි. පාසල් පුස්තකාලයාධිපතිගේ හා ගුරුවරයාගේ කාර්ය භාරය මෙහිදී සවිස්තරවේ.

තුන්වන පරිච්ඡේදය, පාසල් පුස්තකාල ක්ෂේත්‍රය පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු විග්‍රහයක් ඉදිරිපත් කිරීම සඳහා යොදා ගැනේ. මෙහිදී සංවර්ධිත

රටවල් කිහිපයකද, ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වන රටවල් කිහිපයකද පාසල් පුස්තකාල ක්ෂේත්‍රය ක්‍රියාත්මක වන ආකාරය විස්තරවේ. මෙහිදී සංවර්ධිත රටවල් වශයෙන් එක්සත් ජනපදය හා එක්සත් රාජධානිය යොදා ගැණින. සංවර්ධනය වන රටවල් අතරට ශ්‍රී ලංකාව මෙන්ම ඉන්දියාව, උගන්ඩාව, කොස්ටාරිකා , කින්යාව යන රටවල් ද ඇතුලත් කර ඇත. මෙම රටවල්වල සමස්ත පාසල් පුස්තකාල ක්ෂේත්‍රයන්ගේ ක්‍රියාකාරී පසුබිම වඩාත් අවධානයට යොමු කර ඇත.

තෝරාගත් නියැදිය ආශ්‍රයෙන් පර්යේෂණ තොරතුරු ලබාගත් ආකාරය විස්තර කෙරෙන පර්යේෂණ ක්‍රම වේදය, හතරවන පරිච්ඡේදයේ අන්තර්ගත කර ඇත. මෙහිදී පර්යේෂණය ඉදිරිපත් කරනු ලබන 'විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය' අර්ථ දක්වනු ලබන අතර පර්යේෂණ උපකරණ ලෙස භාවිතා කරන ලද ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ කාඩ්පත් පිළිබඳවද කරුණු ඉදිරිපත් කර ඇත.

තෝරාගත් නියැදියේ, යෝජිත උපකරණ මගින් ලබාගත් දත්ත විග්‍රහය පස්වන පරිච්ඡේදයේ දැක්වේ. මෙම දත්ත ඉදිරිපත් කිරීමේදී, සිසුන් ගෙන් ලබාගත් තොරතුරු ප්‍රධාන වශයෙන් මෙසේ ගොනු කරන ලදි. එනම්, සිසුන්ට පාසල් පුස්තකාල පරිහරණ කිරීම අත්‍යාවශ්‍ය වන පුස්තකාල සම්පත්, විෂයමාලාවෙන් අවස්ථාව ලබාදීම, භෞතික හා මානසික වාතාවරණය (පාසල් පුස්තකාලය තුළ) යහපත් ලෙස පැවතීම, ගුරුවරයාගේ මඟ පෙන්වීම, පාසල් පුස්තකාලයාධිපතිගේ මඟපෙන්වීම හා සිසුන්ට පාසලින් බැහැරව පොතපත පරිහරණය සඳහා පවතින වාතාවරණය ආදී වශයෙනි. මේ හැර පාසල් සිසුන් පාසල් පුස්තකාලය පරිහරණය කිරීම සම්බන්ධයෙන් පාසල් වල විදුහල්පතිවරු, පාසල් පුස්තකාලයාධිපතිවරු, ගුරුවරු, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් සහ පාසල් පුස්තකාල ක්ෂේත්‍රය හා සමීප සබඳතා ගොඩ නගා ගැනීමට නෛතිකමය ඉඩ ප්‍රස්ථාව ඇති නිලධාරීන්ගේ අදහස් හා ආකල්පද ඉදිරිපත් කෙරේ.

හයවන පරිච්ඡේදයේ පර්යේෂණ තොරතුරු ආශ්‍රයෙන් දත්ත සමාලෝචනය කිරීම හා යෝජනා ඉදිරිපත් කර ඇත. මේ හැර අනාගත පර්යේෂණ කාර්යයෙහි නියැලෙන්නට පර්යේෂණ ඉඟිද දක්වා ඇත.

# A B S T R A C T

The main objective of this research study is to survey and analyse the use of school libraries by children in Sri Lankan schools.

There is a close relationship between the economy and education of a country. As a developing country educational reorganisation in Sri Lanka has been carried out from time to time to cater to the economic development of the country. In order to enrich the basis of a qualitative educational system it is necessary to pay more attention to the use of school libraries by school children. It is the opinion of the researcher that in the process of educational reconstruction this vital aspect of education has been neglected and it is the teachers' duty to pay more attention to this important aspect.

The dissertation consists of six chapters. The first chapter deals with the introduction of the topic, research evidence relating to school libraries and objectives of the research.

A comprehensive analysis of the concept of 'library' forms the content of the second chapter. The objectives and functions of school libraries, and the role and functions of librarians and teachers in relation to the use of libraries have also been incorporated.

The third chapter deals with a comparative study of school libraries in Sri Lanka together with the use of libraries in a few selected developed and developing countries.

A description of the research methodology forms the basis of the fourth chapter. An account of the 'descriptive research method', the sample, and instruments of research such as questionnaires, interviews, and observation schedules have been included.

The fifth chapter pertains to the analysis of research data taking into consideration the different aspects of the use of libraries by school children.

A summary of research findings together with proposals and suggestions for future research in this field have been included in the sixth chapter.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY